Cancer Council Victoria

Sinhalese

# පිළිකා රෝගීන්ට, ඔවුන්ගේ පවුල් වලට සහ මිතුරන්ට පහත සඳහන් උපකාර සේවා ඔබට සහාය විය හැක

## ලිඛිත තොරතුරු

පිළිකා මාතෘකා ගැන විවිධ භාෂා වලින් ලිඛිත තොරතුරු පරාසයක් **www.cancervic.org.au** වෙතින් ලබා ගැනීමට හෝ Cancer Council Helpline (පිළිකා කවුන්සලයේ උපකාර දුරකතනය) **13 11 20** (ඉංග්‍රීසි) සහ **13 14 50** (ඔබේ භාෂාවෙන් තොරතුරු සඳහා) ඇමතීමෙන් ඔබට නොමිලේ ගෙන්වා ගැනීමට පුලුවන.

## නොමිලේ තොරතුරු සැසිවාර

රෝගීන් සහ පවුලේ අයට ඉංග්‍රීසියෙන් පිළිකා ගැන තොරතුරු සැසිවාර පිරිනැමේ. සමහර සැසි සඳහා භාෂා පරිවර්තකයෙක් ඉල්ලා සිටීමට පුලුවන. පිළිකා රෝග විනිශ්චයක් සහිතව ජීවත්වීම ගැන තොරතුරු මේ සැසි වලින් ඉදිරිපත් කරනු ලැබේ.

## Cancer Connect (පිළිකා සබැඳිය)

තමන්ට සමාන පිළිකා අත්දැකීමක් විඳි කෙනෙක් සමග කතා කිරීමට කැමති රෝගීන්ට සහ පවුල් වලට Cancer Connect (පිළිකා සබැඳිය) සේවය පිරිනැමේ. මෙම සේවය ඔබේම භාෂාවෙන් හෝ භාෂා පරිවර්තකයෙකුගේ සහාය ඇතුව ලබා ගැනීමට පුලුවන.

## Cancer Council Helpline (පිළිකා කවුන්සලයේ උපකාර දුරකතනය)

ඔබ ඉංග්‍රීසි කතා කරන පිළිකා රෝගියෙක්, පවුලේ සාමාජිකයෙක් හෝ මිතුරෙක් නම් Cancer Council Helpline (පිළිකා කවුන්සලයේ උපකාර දුරකතනය) **13 11 20** අමතන්න.

## Multilingual Cancer Information Line (බහුභාෂා පිළිකා තොරතුරු දුරකථනය)

**භාෂා පරිවර්තකයෙකුගේ සහාය ඇතුව පිළිකා සාත්තුසේවකයකුට කතා කරන්න.**

සඳුදා සිට සිකුරාදා දිනවල පෙරවරු 9 සහ 5 අතර වේලාවල ප්‍රදේශීය ඇමතුම් මිළට (ජංගම දුරකථන හැර) **13 14 50** අමතා පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න:

- ඔබට අවශ්‍ය කරන භාෂාව කුමක්ද යන්න පවසන්න
- භාෂා පරිවර්තකයෙක් ලැබෙන තුරු රැඳී සිටින්න (මිනිත්තු 3ක් දක්වා ගතවිය හැක).
- Cancer Council Victoria (වික්ටෝරියානු පිළිකා කවුන්සලයට) 13 11 20 ඔස්සේ සම්බන්ධ කරදෙන ලෙස භාෂා පරිවර්තකයාට පවසන්න.
- ඔබව භාෂා පරිවර්තකයා සහ පිළිකා සාත්තුසේවකයෙක් සමග සම්බන්ධ කරනු ඇත.

## ඔබේ භාෂාවෙන් පිළිකා ගැන තොරතුරු

### ඔබට පිළිකා ගැන ප්‍රශ්න තිබේද?

**පිළිකා කවුන්සලයේ පිළිකා සාත්තුසේවකයකු සමග රහසිගතව කතා කරන්න.**

### අපේ සුහද පිළිකා සාත්තුසේවකයාට පහත සඳහන් උපකාර සැපයිමට පුලුවන:

- පිළිකා ගැන තොරතුරු ඔබට එවීම
- පිළිකා පරීක්ෂණ සහ ප්‍රතිකාර ගැන පහසුවෙන් තේරුම් ගැනීමට පුලුවන් පරිදි තේරුම්කර දීම
- ඔබේ හැඟුම්, ඔබට තිබිය හැකි බිය සහ ප්‍රශ්න ගැන කතා කිරීම
- නීති සහ මුදල් ආධාර ඇතුලු ඔබට උපකාරී වියහැකි සේවාවන් ගැන තොරතුරු සැපයීම

## පිළිකා උපකාර කණ්ඩායම්

උපකාර කණ්ඩායම් වලට පැමිනෙන ලෙස රෝගීන්ට සහ පවුලේ අයට ආරාධනා කෙරේ. මිත්‍රශීලී වටපිටාවක් තුල ඔබේ පිළිකා අත්දැකීම ගැන කතා කරන්න. ඔබේ භාෂාව කතා කරන කණ්ඩායමක් ඔබ සිටින පලාතේ සිටින්නට පුලුවන.

## දුරකථන සහ අන්තර්ජාල උපකාර කණ්ඩායම්

පිළිකා රෝගීන්ට සහ ඔවුන්ගේ පවුල් වල අයට තම පිළිකා අත්දැකීම් දුරකථනය සහ අන්තර්ජාලය ඔස්සේ අනෙක් අය සමග බෙදාහදා ගැනීමට අවස්ථාව Cancer Council (පිළිකා කවුන්සලය) මගින් පිරිනමනු ලැබේ.

*“මම සිටින තත්වයට සමාන තත්වයක සිටි තවත් කෙනෙකු සමග කතා කිරීමෙන් මගේ හුදකලා බව අඩුවී ගිය බව මට හැඟුනා. එය ඉමහත් උපකාරයක් වුනා.”*